# කොළඹ අධ්‍යාපන කලාපය
අවසාන වාර ඇගයීම - 2016
නාට්‍ය හා රංග කලාව - 12 ශ්‍රේණිය
I පත්‍රය

පැය එක යි.

## I කොටස

විභාග අංකය :- ..................

උපදෙස්
- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- ප්‍රශ්න අංක 1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින්, නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය, ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

---

01) වෙනත් කලාවන් හා සැසඳීමේ දී ප්‍රාසාංගික ලක්ෂණ අතින් වඩාත් ම පොහොසත් කලාව ලෙස හැඳින්විය හැක්කේ,
1) නර්තනය යි.
2) බැලේ නාට්‍යය යි.
3) නාට්‍යය යි.
4) සංගීතය යි.
5) අභිරූපණය යි.

(...............)

02) නාට්‍ය දර්ශනයක් සම්පූර්ණ වීමට අත්‍යවශ්‍ය අංග ත්‍රය වනුයේ,
1) නාට්‍ය පෙළ, අධ්‍යක්ෂක, නළුනිළියන් ආදිය යි.
2) අධ්‍යක්ෂක, නිෂ්පාදක හා නළුනිළියන් ආදිය යි.
3) නළුනිළියන්, ප්‍රේක්ෂාව, හා ප්‍රේක්ෂකයන් ආදිය යි.
4) නාට්‍ය පෙළ, නළුනිළියන් හා ප්‍රේක්ෂකයන් ආදිය යි.
5) අධ්‍යක්ෂක, ආනුෂාංගික අංග හා නළු නිළියන් ආදිය යි.

(...............)

03) නාට්‍ය පෙළ පිළිබඳ සාවද්‍ය ප්‍රකාශයක් වන්නේ,
1) නාට්‍ය පෙළක් ලිඛිත හෝ අලිඛිත විය හැකි ය.
2) කිසියම් අවස්ථාවක්, සිද්ධියක් හෝ අත්දැකීමක් පදනම් කරගෙන නාට්‍ය පෙළක් නිර්මාණය කරනු ලබයි.
3) නාට්‍ය පෙළෙහි ප්‍රබලත්වය සාර්ථක නාට්‍ය නිෂ්පාදනයකට වඩාත් හේතු වෙයි.
4) නාට්‍ය පෙළෙහි ඇති කතා පුවත මුල, මැද, අග වශයෙන් සිද්ධි පිළිවෙලින් පෙළ ගස්වා තිබිය යුතු ය.
5) නාට්‍ය රස වින්දනයට මෙන්ම විචාරයට ද මූලික පදනම වනුයේ නාට්‍ය පෙළ යි.

(...............)

04) පහත සඳහන් අභ්‍යාස අතුරෙන් රංග අභ්‍යාසයක් නොවන්නේ,
1) ශ්වසන අභ්‍යාසය යි.
2) කටහඬ අභ්‍යාසය යි.
3) රිද්ම අභ්‍යාසය යි.
4) තාපන අභ්‍යාසය යි.
5) සතතාභ්‍යාසය යි.

(...............)

05) සංස්කෘත නාට්‍යය ක කතා වස්තුව විකාශනය වන්නේ,
1) ප්‍රධාන කොටස් 2 ක් යටතේ ය.
2) ප්‍රධාන කොටස් 3 ක් යටතේ ය.
3) ප්‍රධාන කොටස් 4 ක් යටතේ ය.
4) ප්‍රධාන කොටස් 5 ක් යටතේ ය.
5) ප්‍රධාන කොටස් 6 ක් යටතේ ය.

(...............)

**ප්‍රශ්න අංක 6 - 10 දක්වා ප්‍රශ්නවලට පහත තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

A- කඩවත් තරණයක් ඇත.
B- ගැස් ලාම්පු මුල් වරට ආලෝකය සපයා ගැනීමට යොදා ගැනුනි.
C- පස් ගොඩ ගසා සකස් කරගෙන ඇත.
D- වෙස්මුහුණු පැළඳීම ප්‍රධාන වේ.
E- වෙස් ඇඳුම් කට්ටලයෙන් අඩක් පළඳියි.
F- ස්ත්‍රීන් රංගවතරණය වේ.
G- උරුට්ටුව ඇත.
H- පත්තිනි ඇදහිල්ලක් ලෙස ද සැලකෙයි.
I- පහතරට නර්තන අවස්ථාවලින් පොහොසත් ය.
J- බම්මන්නා චරිතය දක්නට ලැබේ.
K- කතෝලික ආභාසය ඇති කතා පුවත් වලින් යුක්ත ය.

06) නාඩගම් නාට්‍ය කලාවට අදාළ වගන්ති වනුයේ,
1) A, B, C ය.
2) D, E, F ය.
3) G, H, I ය.
4) J, K, A ය.
5) C, G, K ය.
(..............)

07) නුර්ති නාට්‍ය කලාවේ ලක්ෂණය වේ.
1) B, F, J ය.
2) F, G, J ය.
3) C, E, K ය.
4) A, H, I ය.
5) J, C, B ය.
(..............)

08) කෝලම් ගැමි නාටකයේ ලක්ෂණයන් ය.
1) A හා C ය.
2) D හා I. ය.
3) K හා J ය.
4) D හා E ය.
5) F හා G ය.
(..............)

09) "A, E, H" අක්ෂරවලින් දැක්වෙන්නේ,
1) නුර්ති නාට්‍යවල ලක්ෂණයන් ය.
2) නාඩගම් නාට්‍යවල ලක්ෂණයන් ය.
3) කෝලම් නාට්‍යවල ලක්ෂණයන් ය.
4) සොකරි නාට්‍යවල ලක්ෂණයන් ය.
5) ශාන්තිකර්මවල ලක්ෂණයන් ය.
(..............)

10) C හා D අක්ෂර වලින් දැක්වෙන්නේ නාට්‍ය සම්ප්‍රදායයන් දෙකකට අදාළ ලක්ෂණයන් ය. එම ලක්ෂණ අයත් නාට්‍ය සම්ප්‍රදායයන් දෙකට අදාළ පොදු ලක්ෂණයක් වන්නේ,
1) උඩරට ප්‍රදේශයේ පැවැත්වීම යි.
2) දෙකෙහිම විධිමත් නාට්‍ය පිටපත් රචකයක් සිටීම යි.
3) අර්ධකවාකාර රංගභූමියක රඟ දැක්වීම යි.
4) මංගලම් ගියකින් අවසන් වීම යි.
5) පූර්ව රංගය හා අපර රංගය ලෙස බෙදා තිබීම යි.
(..............)

11) ඇතමුන් විවිධ මතවාද ගොඩනැඟුව ද භරත මුනිවරයා විසින් හඳුන්වා දුන් තෙවැදෑරුම් රූඟුම්වලින් නෘත්තයෙහි අන්තර්ගත අභිනය වනුයේ,
1) ආංගික අභිනය යි.
2) වාචික අභිනය යි.
3) ආහාර්ය අභිනය යි.
4) සාත්ත්වික අභිනය යි.
5) කිසිදු අභිනයක් අන්තර්ගත නැත.
(..............)

12) අභිනය දර්පණයෙහි නෘත්‍ය පිළිබඳව දක්වා **"ආංගිකාභිනයෙරෙව භාවනෙව ව්‍යනක්තියත්"** යන සංස්කෘත ශ්ලෝකයෙහි දෙවෙනි පදය වනුයේ,

1) තන්නාත්‍යං මාර්ගශබ්ධෙන ප්‍රසිද්ධ නෘත්‍යවේදිනාම්
2) ආසෙ‍යනාලම්බයේ ද් ගිතං හස්තේනාර්ථං ප්‍රදර්ශනයෙන්
3) චක්ෂුර්භ්‍යාං දර්ශයේ ද් භාවං පාදාභ්‍යාං තාලමාචරෙත්
4) චතුර්ධාභිනයොපෙතං ලක්‍ෂණාචෘත්තිනො බුධෛ ඃ ය.
5) නර්තනං නාට්‍ය මිත්‍යුක්තං සර්වත්‍රාභිනයො භාවෙත් ය.

(...............)

13) නාට්‍යය යනු ජීවිතයේ පිටපතකි. සිරිත් විරිත්වල කැඩපතකි. යනුවෙන් ප්‍රකාශ කර ඇත්තේ,

1) ඇරිස්ටෝටල් පඬිතුමා ය.
2) භරතමුණි පඬිතුමා ය.
3) ඇලඩයිස් නිකොල් ය.
4) ධනංජය පඬිතුමා ය.
5) බර්නාඩ් ෂෝ ය.

(...............)

14) නූර්ති නාට්‍ය කලාවේ පුරෝගාමිවරයා ලෙස සැලකෙන්නේ,

1) විශ්වනාත් ලොජි ය.
2) පීටර් ද සිල්වා මහතා ය.
3) නිතිඥ ජෝන් ද සිල්වා මහතා ය.
4) චාල්ස් ඩයස් මහතා ය.
5) සී. දොන් බස්තියන් ජයවීර මහතා ය.

(...............)

**ප්‍රශ්න අංක 15 - 20 දක්වා ප්‍රශ්න වලට පහත තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

A- සක්දෙව් රජ මහල්ලෙකු වෙස් ගෙන පැමිණේ.
B- නල්ලසාඳි ගුරු නම් තැනැත්තෙකුට දානයක් පිළියෙල කරන ආකාරය දක්වයි.
C- ස්නානය කරන විට ක්‍රියාත්මක කෙරෙන ක්‍රියා පිළිවෙත් නිරූපණය වේ.
D- මිනිසාට වැළඳෙන විවිධ ලෙඩ රෝග සංකේතවත් ව ඉදිරිපත් වේ.
E- වඩිග පුර දේසේන් බමුණන් සත් දෙනෙක් බමුණන් ඇවිදින් කළ යාගය කි.
F- සමාජ කුල ක්‍රමය අනුව බෙදී තිබීම පිළිබඳ ඉඟි සපයන නාට්‍යමය අවස්ථාවකින් සමන්විත ය.
G- ඇතෙකු බැඳ ගැනීම හා මීමෙකු බැඳ ගැනීමක් එය දෙවියන්ට කැප කිරීමත් සිදු වේ.
H- ගව පට්ටි සංරක්ෂණය කිරීම සඳහා පවත්වයි.
I- තරුණියක්, ගැබ්බර කාන්තාවක් හා මවක් ලෙස පැමිණෙන කාන්තා චරිතයක් පිළිබඳ නිරූපණය වේ.

15) ඉහත තොරතුරු ඇසුරෙන් කොහොඹා කංකාරියට අයත් නාට්‍යමය අවස්ථා රැගත් අක්ෂර මොනවාද?

1) A හා B ය.
2) C හා D ය.
3) C හා E ය.
4) B හා F ය.
5) F හා H ය.

(...............)

16) 'D' හා 'I' අක්ෂරවලට අදාළ ප්‍රකාශ අයත් වන්නේ,

1) රට යකුම ශාන්තිකර්මයට ය.
2) සන්නි යකුම ශාන්තිකර්මයට ය.
3) දෙවොල්මඩු ශාන්තිකර්මයට ය.
4) සූනියම් යාගය ශාන්තිකර්මයට ය.
4) මංගරමඩු ශාන්තිකර්මයට ය.

(...............)

17) ගම් මඩුව, දෙවොල් මඩුව, රටයකුම, සූනියම් යාගය යන ශාන්තිකර්ම වලට පිළිවෙලින් අයත් වන අක්ෂර වන්නේ,

1) A, C හා E ය.
2) A, B හා C ය.
3) C, D හා E ය.
4) D, E හා F ය.
5) A, B හා D ය.

(...............)

18) ගම්මඩුව, පහන්මඩුව, මංගර සමයම යන ශාන්තිකර්ම තුනටම පොදුවේ යෙදෙන නාට්‍යමය පෙළපාලිය ක අවස්ථාවක් ලෙස දැක්විය හැකිය.

1) H ය.
2) E ය.
3) G ය.
4) C ය.
5) F ය.

(..............)

19) 'E' අක්ෂරයෙන් දැක්වෙන ප්‍රකාශය ට අදාළ ශාන්තිකර්මයෙ හි එන තවත් නාට්‍යමය පෙළපාලියකි.

1) ගබඩා කොල්ලය
2) කපුයක්කාරිය
3) පැදුරේ දැපවිල්ල
4) රාම මැරීම.
5) වඩිග පටුන

(..............)

20) 'H' අක්ෂරයෙන් දැක්වෙන අදාළ අරමුණ වඩාත් අදාළ වන යාතු කර්මය වනුයේ,

1) මංගර මඩුව හෙවත් මංගර සමයමට ය.
2) කොහොඹා කංකාරියට ය.
3) රටයකුමට ය.
4) දෙවොල් මඩුවට ය.
5) සොකරි ගැමි නාටකයට ය.

(..............)

21) පහත දැක්වෙන්නේ නාට්‍ය නිෂ්පාදනයක් හා සම්බන්ධ ප්‍රකාශයන් කිහිපයකි.

A- නාට්‍ය නිෂ්පාදනයක් සම්බන්ධව මූලික වගකීම දරනු ලබන්නේ නාට්‍ය අධ්‍යක්ෂ විසිනි.
B- නාට්‍ය රචකයා විසින් රචනා කරන ලද නාට්‍ය පිටපත සජීවී කලා කෘතියක් ලෙස වේදිකාවේ ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා මූලික වන්නේ නාට්‍යයේ නිෂ්පාදකවරයා ය.
C- නාට්‍ය නිෂ්පාදනයක් සඳහා මුදල් යොදවනු ලබන්නේ අර්ථවත් ය.
D- ඇතැම් විට එකම නාට්‍ය පිටපතක් අර්ථකථන මතු කරමින් නිර්මාණය කිරීමට අධ්‍යක්ෂකවරුන්ට හැකියාව ඇත.

උක්ත ප්‍රකාශ අතුරෙන්,

1) A, B හා D නිවැරදි ය.
2) A, C හා D නිවැරදි ය.
3) A හා C පමණක් නිවැරදි ය.
4) A හා D පමණක් නිවැරදි ය.
5) A, B, C, D සියල්ලම නිවැරදි ය.

(..............)

The National e-Learning Portal for The General Education

22) නූතන ප්‍රොසීනියම් වේදිකාව පරිහරණය කිරීමේ පහසුව තකා වේදිකාව; භූගෝලීය වශයෙන් කොටස් 9 කට බෙදා දැක්විය හැකිය. මෙම රූප සටහනේ ලකුණු කොට ඇති අක්ෂරවලට අදාළ එම කොටස් නිවැරදිව, පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

| | | |
|---|---|---|
| A | | |
| | B | |
| | | C |

1) ඉහළ දකුණ, මැද හා පහළ වම ය.
2) ඉහළ වම, මැද හා පහළ දකුණ ය.
3) ඉහළ, මැද හා පහළ වේදිකාව ය.
4) පහළ වම, මැද හා ඉහළ දකුණ ය.
5) පහළ දකුණ, මැද හා ඉහළ වම ය.

(..............)

23) ග්‍රීක නාට්‍ය කලාවේ භාවිතා වන ප්‍රමුඛ අභිනය වනුයේ,

1) සාත්වික අභිනය යි.
2) වාචික අභිනය යි.
3) ආහාර්ය අභිනය යි.
4) ආංගික අභිනය යි.
5) සියලුම අභිනයන් ප්‍රමුඛ වේ.

(..............)

24) ග්‍රීක නාට්‍ය රඟ දැක්වීමක් ආරම්භ වූයේ දවසේ,

1) පූර්ව භාගයේ දී ය.
2) රාත්‍රී කාලයේ දී ය.
3) සන්ධ්‍යා කාලයේ දී ය.
4) මධ්‍යහ්නයේ දී ය.

5) අපර භාගයේ දී ය. (..............)

**ප්‍රශ්න අංක 25-30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු ආශ්‍රය කරගන්න.**

A- නාට්‍යය යනු කාර්යානුකරණය කි.
B- සංස්කෘත කතා වින්‍යාසය තුළ හට ගන්නා ගැටුම් අවස්ථා වේ.
C- බම්මන්තා චරිතය සංස්කෘත නාට්‍යවල විදූෂක චරිතයට සමානව නිරූපණය කරයි.
D- ගුණසේන ගලප්පත්ති මහතා විසින් සඳ කිඳුරු නාට්‍යය නිර්මාණය කළේ ගැමි නාටක ඇසුරෙනි.
E- රමණීය භාෂා ප්‍රයෝග යෙදිය යුතු බව කියවේ.
F- මනස මුල්කරගෙන හට ගන්නා භාවයන් නිරූපණය කිරීමක් පෙරදිග රූපණයේ දී දක්නට ලැබේ.
G- සේරිවාණිජ ජාතක කතාව මූලාශ්‍ර කරගෙන ඇත.
H- ස්ත්‍රී චරිත ස්ත්‍රීන් විසින්ම රඟපෑ පැරණි පෙරදිග සම්භාව්‍ය නාට්‍ය සම්ප්‍රදාය වේ.
I- චරිතයක් තමාගේ අදහස් අන් පාත්‍රයන් ට ද, ප්‍රේක්ෂකයන්ටද ඇසෙන සේ කරන භාෂණ වර්ගයක් ඇත.

25) නූර්ති නාට්‍ය කලාවට අදාළ ලක්ෂණයක් හා විශේෂයෙන්ම ජෝන් ද සිල්වා ගුරුන්ගේ නූර්තිවල සුවිශේෂ ලක්ෂණයක් ද වේ.
1) A ය. 2) B ය. 3) C ය. 4) D ය. 5) E ය.
(..............)

26) කවි නාඩගම් සම්බන්ධව ඉදිරිපත් වන විශේෂ වගන්තිය වේ.
1) H ය. 2) G ය. 3) F ය. 4) E ය. 5) D ය.
(..............)

27) 'I' අක්ෂරයෙන් කියවෙන්නේ,
1) ආත්මගත භාෂණය පිළිබඳව ය.
2) ස්වගත භාෂණය පිළිබඳව ය.
3) ආකාශ භාෂණය පිළිබඳව ය.
4) ඒකල භාෂණය පිළිබඳව ය.
5) ප්‍රකාශ භාෂණය පිළිබඳව ය.
(..............)

28) 'G' අක්ෂරයෙන් කියවෙන වගන්තියට අදාළ නාට්‍ය නිර්මාණය වන්නේ,
1) කදා වළලු නාට්‍යය යි.
2) රත්තරං නාට්‍යය යි.
3) එළොව ගිහින් මෙළොව ආවා නාට්‍යයෙනි.
4) මහාසාර නාට්‍යය යි.
5) වෙල්ලවැහුම් නාට්‍යය යි.
(..............)

29) ග්‍රීක ට්‍රැජඩිය පිළිබඳ නිර්වචනයේ දී සඳහන් වන එක් විශේෂ කරුණක් අයත් අක්ෂරය වන්නේ,
1) A ය. 2) B ය. 3) C ය. 4) D ය. 5) E ය.
(..............)

30) 'H' අක්ෂරයෙන් සඳහන් වන්නේ කවර නාට්‍ය සම්ප්‍රදායක් පිළිබඳව ද?
1) සංස්කෘත නාට්‍ය සම්ප්‍රදාය පිළිබඳව ය.
2) ග්‍රීක නාට්‍ය සම්ප්‍රදාය පිළිබඳව ය.
3) එලිසබතීන නාට්‍ය සම්ප්‍රදාය පිළිබඳව ය.
4) රෝම නාට්‍ය සම්ප්‍රදාය පිළිබඳව ය.
5) ජපන් නාට්‍ය සම්ප්‍රදාය පිළිබඳව ය.
(..............)

31) නාට්‍ය කලාව හා සම්බන්ධ ප්‍රේක්ෂාව නැමැති සංකල්පය, වේදිකාවේ **"දෘෂ්ටි ගෝචර භාවය"** යනුවෙන් දැක්වූයේ,
1) ධනංජය පඬිතුමා විසිනි.
2) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් විසිනි.
3) ඇරිස්ටෝටල් විසිනි.
4) ස්ටැනිස්ලාව්ස්කි විසිනි.

5) හරතමුනි විසිනි. (..............)

**ප්‍රශ්න අංක 32-35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත වගුව ආශ්‍රය කරගන්න.**

| මුල් කෘතිය | මුල් නිර්මාණකරු | පරිවර්තන නාමය | මෙරට සිංහල පරිවර්තකයා |
|---|---|---|---|
| Dragon | යෙව්ගිනි ෂ්වාට්ස් | A | B |
| C | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | හුණුවටයේ කතාව | හෙන්රි ජයසේන |
| Doll's House | E | රූකඩ ගෙදර | F |
| Chery orchard | H | චෙරි උයන | රංජිත් ධර්මකීර්ති |

32) A හා B හ අක්ෂරවලට පිළිවෙලින් අයත් වන්නේ,
1) "ධවල භීෂණ" හා ධර්මසිරි බණ්ඩාරනායක යන නාමයන් ය.
2) "මකරාක්ෂයා" හා ලූෂන් බුලත්සිංහල යන නාමයන් ය.
3) "පුත්‍ර සමාගම" හා ධර්මසිරි බණ්ඩාරනායක යන නාමයන් ය.
4) "මකරාක්ෂයා " හා ධර්මසිරි බණ්ඩාරනායක යන නාමයන් ය.
5) "රෝමය ගිනි ගනී" හා බන්දුල විතානගේ යන නාමයන් ය.
(..............)

33) 'C' අක්ෂරයේ යෙදෙන මුල් කෘතියේ නම වන්නේ,
1) The glass menageries
2) The Caucasian Chalk Circle
3) Mother Courage
4) Dumb Waiter
5) Blood Wedding
(..............)

34) පිළිවෙලින් E හා F අක්ෂරවලට අයත් නිවැරදි පිළිතුරු මොනවාද?
1) හෙන්රික් ඉබ්සන් හා විජිත ගුණරත්න ය.
2) හෙන්රික් ඉබ්සන් හා සුනිල් විජේසිරිවර්ධන ය.
3) ඇන්ටන් චෙකොෆ් හා රංජිත් ධර්මකීර්ති ය.
4) සැමුවෙල් බෙකට් හා ගුණනාථ ඔබේසේකර ය.
5) ශේක්ස්පියර් හා විජිත ගුණරත්න ය.
(..............)

35) 'H' අක්ෂරයට අවශ්‍ය පිළිතුර වන්නේ,
1) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය.
2) ශ්‍රී හර්ෂ ය.
3) හෙන්රික් ඉබ්සන් ය.
4) ස්ටැනිස්ලාව්ස්කි ය.
5) ඇන්ටන් චෙකොෆ් ය.
(..............)

36) පහතින් දැක්වෙන්නේ **"රංගභූමි පාලකවරයා"** සම්බන්ධයෙන් පළකල මත කිහිපයකි.
A- රංගභූමිය මත දිග හැරෙන නාට්‍යයේ සියලු ම වගකීම් දරන්නේ රංගභූමි පාලකයා ය.
B- රංගභූමි පාලක ඇතැම් විට වේදිකා පාලක ලෙස ද, රංග කළමනාකරු ලෙස ද හැඳින්වේ.
C- නාට්‍ය නිෂ්පාදනයක දී දර්ශන සංවිධානය කිරීම, රංගභූමිය හා නළුනිළියන් හා සම්බන්ධ සියලු ම කටයුතු කරනු ලබන්නේ රංග භූමි පාලකයා ය.
1) A පමණක් නිවැරදි ය.
2) A හා B පමණක් නිවැරදි ය.
3) A, B හා C තුනම නිවැරදි ය.

4) B හා C පමණක් නිවැරදි ය.

5) A හා C පමණක් නිවැරදි ය.

(..............)

37) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ **"හස්තිකාන්ත මන්තරේ"** නාට්‍යයෙහි කතා පුවතට අදාළ මූලාශ්‍රයක් නොවනුයේ,

1) බෘහත් කථා ය.
2) කතාසරිත් සාගරය යි.
3) පාලි ධම්ම පදට්ඨ කතාව යි.
4) පද්ම පුරාණය යි.
5) සිංහල සද්ධර්මරත්නාවලිය යි.

(..............)

38) "අභිඥාන ශාකුන්තලය" නාට්‍යයේ රචකයා වනුයේ,

1) කාලිදාසයන් ය.
2) ශ්‍රී හර්ෂයන් ය.
3) භාස ය.
4) ශූද්‍රක ය.
5) භරත මුනිවරයා ය.

(..............)

39) 'සංස්කෘත නාට්‍යකරුවා විවිධ හේතු මත වේදිකාවේ නොපෙන්විය හැකි කරුණු පිළිබඳව ප්‍රේක්ෂකයාට අවබෝධයක් ලබා දීම සඳහා අර්ථෝපක්ෂේප ක්‍රම යොදා ගනු ලබයි. ඒ ආකාරයට, ශාකුන්තලයෙහි ශිෂ්‍යයෙකු විසින් ශකුන්තලා අවිවෙන් පීඩා විඳින බව පැවසීම අයත් වන අර්ථෝපක්ෂේප ක්‍රමය වනුයේ,

1) විශ්කම්භක යි.
2) ප්‍රවේශක යි.
3) චූලිකා යි.
4) අංකාවතාර යි.
5) අංකමුඛ යි.

(..............)

40) ඇන්ටිගනී නාට්‍යයෙහි, වීර චරිතය වන්නේ,

1) ඇන්ටිගනී ය.
2) හීමන් ය.
3) ක්‍රෙයෝන් ය.
4) ඊඩිපස් ය.
5) පොලිනිසස් ය.

(..............)

The National e-learning Portal for The General Education

පැය දෙක යි.

## II කොටස

**උපදෙස්**

- A හා B කොටස් වලින් එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන, සම්පූර්ණ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

### A කොටස

01) 1) කලාවේ විවිධ ප්‍රභේද තුනක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 4 යි.)
2) වේදිකා නාට්‍ය කලාව හැර **ප්‍රාසාංගික කලා** මාධ්‍ය දෙකක් නම් කර ඒවායේ සුවිශේෂී ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 5 යි.)
3) **"නාට්‍ය කලාව"** සෙසු කලා මාධ්‍යවලින් වෙනස් වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 6 යි.)

02) 1) **"රූපණය"** යන්න සැකෙවින් හඳුන්වන්න. (ලකුණු 4 යි.)
2) රූපණ ශිල්පියෙක් නාට්‍යයක යම් චරිත නිරූපණයකට ප්‍රවේශ වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)
3) **"සතර අභිනය"** සංකල්පය නාට්‍යය ක අන්තර්ගතව ඇති ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 6 යි.)

03) 1) නාට්‍ය පිටපතක් තුළ ඇති සුවිශේෂී ලක්ෂණයේ මොනවාද? (ලකුණු 4 යි.)
2) නාට්‍ය පෙළ රංගයක් බවට පත් කිරීමේ ක්‍රියාවලිය විස්තර කරන්න. (ලකුණු 5 යි.)
3) නාට්‍යයකට ආනුෂාංගික අංග එක් කර ගැනීමේ දී නාට්‍ය අධ්‍යක්ෂවරයා අවධානය යොමුකළ යුතු කරුණු දක්වන්න. (ලකුණු 6 යි.)

### B කොටස

04) 1) නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත බෞද්ධ පූජා කර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 4 යි.)
2) උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් ශාන්තිකර්මයක් බැගින් නම් කර ඒවාට අයත් වන නාට්‍යමය පෙළපාලි **දෙක** බැගින් නම් කරන්න. (ලකුණු 5 යි.)
3) ඉහතින් සඳහන් කල නාට්‍යමය පෙළපාලියක් අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ විමසන්න. (ලකුණු 6 යි.)

05) 1) සොකරි සහ කෝලම් ජන නාටකවල ඇති වෙනස්කම් **හතර** බැගින් දක්වන්න. (ලකුණු 4 යි.)
2) නාඩගම් නාට්‍යවලට වඩා නූර්ති නාට්‍ය ජනප්‍රිය වීමට බලපෑ හේතු **පහක්** දක්වන්න.(ලකුණු 5 යි.)

3) ටීටර් හා මිනර්වා නාට්‍ය සම්ප්‍රදායන් විග්‍රහ කරන්න. (ලකුණු 6 යි.)

06) 1) සකුන්තලා නාට්‍යය ට පදනම් වූ මූලාශ්‍රය නම් කර, එම කතා පුවත සැකෙවින් දක්වන්න. (ලකුණු 4 යි.)

2) සකුන්තලා නාට්‍යයෙන් මතු කරන සංස්කෘත රංග ශෛලිය නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

3) සකුන්තලා නාට්‍යයෙහි සකුන්තලා හා දුෂ්‍යන්ත රජ යන චරිත පිළිබඳව විවරණයක් යෙදෙන්න. (ලකුණු 6 යි.)